# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## සිසුතරණ මාසික පරීක්ෂණය

## 2019 ජනවාරි

10 ශ්‍රේණිය — කාලය විනාඩි 40යි

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

නිවැරදි වරණය තෝරන්න.

1.ලෝක ඉතිහාසයේ මෙතෙක් හමු වී ඇති පැරණි ම ලේඛන සාධක අයත් වන්නේ කිනම් කාලයකට ද?

(1) ක්‍රි.පූ.2000 – ක්‍රි.පූ.1500 (2) ක්‍රි.පූ.3500 – ක්‍රි.පූ.3000(3) ක්‍රි.පූ.4000 - ක්‍රි.පූ.3500 (4) ක්‍රි.පූ.5000 - ක්‍රි.පූ.4500

2.සම්මත සිංහල හෝඩියේ අක්ෂර කීයද?

(1) 30 (2)32 (3)60 (4) 54

3.ස්වර සහ ව්‍යඤ්ජන සංඛ්‍යාව කීය ද?

(1)18 සහ 42 (2)20 සහ 42 (3)16 සහ 40 (4) 18සහ 40

4.කණ්ඨජ අක්ෂර ඇතුළත් වරණය තෝරන්න.

(1)ච,ඡ,ජ,ඣ,ඤ (2)ප,ඵ,බ,භ,ම (3)ට,ඨ,ඩ,ඪ,ණ (4) ක,ඛ,ග,ඝ,ඞ

5.නාසික්‍ය අක්ෂර ඇතුළත් වරණය තෝරන්න.

(1)ක,ච,ට,ත,ප (2)භ,ජ,ඩ,ද,ඹ (3)ඞ,ඤ,ණ,න,ම (4) ඝ,ඣ,ඪ,ධ,භ

6.අන්තස්ථ අක්ෂර මොනවා ද?

(1) ය,ර,ල,ව (2) ශ,ෂ,ස,හ (3)ට,ඨ,ඩ,ඪ (4) ච,ඡ,ජ,ඣ

7.මහාප්‍රාණ අක්ෂර පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ඛ,ච,භ,ස (2) ඛ,ඣ,භ,ග (3) ඛ,ඣ,බ,ස (4) ඛ,ඣ,භ,ස

8.මූර්ධජ අක්ෂර පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1)ට,ඩ,ණ,ස (2) ට,ඩ,ණ,ඪ (3) ට,ඩ,න,ඪ (4) ට,ත,ණ,ඪ

9.සඤ්ඤක අක්ෂර පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1)ට,ඳ,ඹ,ඬ (2)ජ,ඳ,ඹ,ළ (3)ජ,ඳ,ඹ,ඬ (4) ළ,ජ,ඵ,ඹ

10.අඝෝෂ අක්ෂර පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) ක,ඵ,ශ,ට (2)ග,ඵ,ශ,ට (3)ක,ල,ශ,ට (4) ඹ,ඵ,ශ,ට

11.ඝෝෂ අක්ෂර පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) ට,ය,ඩ.ඪ (2)ක,ග,ස,ඞ (3) ත,ද,ධ,න (4) අ,ග,ළ,ණ

12.පූර්ණ නාසිකා අක්ෂරයක් යෙදුණු වචනය තෝරන්න.

(1)මනඃකල්පිත (2) නුවණ (3) ගංගාව (4) ශාස්ත්‍රීය

13.සංයුක්ත ස්වරයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

(1)පිපිඤ්ඤා (2) ඓතිහාසික (3) භෞතික (4) දෛනික

14.කණ්ඨ ඕෂ්ඨජ අක්ෂරයක් ඇතුළත් වචනය තෝරන්න.

(1)සරල (2) වරණය (3)ඖෂධ (4) සඳලු තලය

15.විසර් ගය යෙදුණු වචනය කුමක් ද?

(1) සංකල්පනාව (2) ටොපි (3) විශේෂ (4) අන්තඃබණ්ඩය

- උපසර්ග ඇතුළත් නොවන පදය තෝරන්න.

(16)(1)උදුළ (2)නිරතුරු (3)සපුරන (4)විචිත්‍ර

(17) (1)උපවන (2)අබිරහස් (3)ඉක්බිති (4)අතිරික්ත

(18) (1) කැටුව (2) උපනායක (3)ප්‍රබල (4)අවලක්ෂණ

- උපසර්ග ඇතුළත් පදය තෝරන්න.

(19) (1)තරම් (2)පිණිස (3)ඉතින් (4)පරිපූර් ණ

(20) (1) සඳහා (2) සුසිරිත් (3)වනාහි (4)දැන්

- මිශ්‍ර ක්‍රියාවක් ඇතුළත් නොවන පදය තෝරන්න.

(21) (1) අතුරුදහන් (2)ගයමින් (3)කියමින (4)බොමින්

(22) (1)සිනාසිසී (2)විඳිමින් (3)ලියමන් (4)බලබලා

(23) (1)කකා (2)බොමින් (3)වැටෙමින (4)නැටුම්

- මිශ්‍ර ක්‍රියා පදය තෝරන්න.

(24) (1)කියුම් (2)ගය ගයා (3)කියමන් (4) විඳිව්

(25) (1)කියූ (2)දී (3)බිබී (4) ගැයුම්

(ලකුණු 2 × 25 = **50යි**)